**අම්බලන්ගොඩ නගර සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 12 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයට අදාළ රු.255,742 ක ගෙවීම් ප්‍රවර්තන වර්ෂයේ වියදමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.14,758,140 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ජංගම වත්කම් අඩුවෙන් පෙන්නුම් කෙරුණි.

(ඇ) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදල් රු.246,483 ක් ගිණුම්ගත නොකිරීම හේතු කොටගෙන ආදායම් සහ ලැබිය යුතු ශේෂ අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) කර්මාන්ත 02 ක් වෙනුවෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු රු.209,324 ක් මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ලෙස දැක්වීම නිසා ණයහිමියෝ සමාන අගයෙන් වැඩියෙන් හා ණයගැතියෝ සමාන අගයෙන් අඩුවෙන් දැක්වුණි.

## 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.51,476,993 ක් වූ ගිණුම් විෂයයන් 14 කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛන අනුව දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.44,631,211 ක අසමානතා නිරීක්ෂණය විය.

(ආ) එකිනෙක සමාන විය යුතු සේවක ඇප තැන්පත් ශේෂය හා සේවක ඇප ආයෝජන ගිණුමේ ශේෂය අතර රු.26,826 ක වෙනසක් දක්නට ලැබුණි.

## 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වසර 06 කට වඩා වැඩි කාලයක් තිස්සේ හිඟව පැවති රු.8,334,529 ක් වූ තානායම් කුලී හා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වන්දි රු.6,402,250 ක් ද ඇතුළුව සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු රු.109,338,404 ක් නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට බේරුම් නොකළ බැරකම් රු.70,727,474 ක් පැවැතුණි. මෙම ශේෂය තුළ ඇතුළත් එකතුව රු.6,995,459 ක් වූ ශේෂවලට අදාළ කාලවිශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවලට අනුව පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු හිඟ දායක මුදල්වල එකතුව රු.11,166,432 ක් වී තිබුණි.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.73,913,952 ක් වූ බස් නැවතුම්පල ජල ව්‍යාපෘති ගිණුම, එකතුව රු.73,251,732 ක් වූ ගෙවිය යුතු ගිණුම් හා එකතුව රු.8,869,302 ක් වූ හිඟහිටි ආදායම් ගිණුම් සම්බන්ධව ලිපිගොනු හා ගිණුම් ශේෂ තහවුරු කෙරෙන ලිපි ද, එකතුව රු.77,767,795 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 05 ක් සම්බන්ධයෙන් යාවත්කාලීන හා විධිමත්ව පවත්වාගෙන ගිය ස්ථාවර වත්කම් ලේඛනයක් ද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 110 | නැතිවීම්, හානිවීම් පිළිබඳව වාර්තා කිරීමට අනුමත ආකෘතිය ප්‍රකාර තීරු 11 කින් යුත් හානි පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396(ඇ) | නගර සභාවේ බැංකු ජංගම ගිණුම් දෙකකට අදාළව නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල වලංගු කාලය ඉක්මවා තිබුණු එකතුව රු.96,305 ක් වූ චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.22,050,881 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,757,495 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,293,386 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 කාරක ප්‍රාග්ධන කළමණාකරණය

ඉකුත් වර්ෂවලට සාපේක්ෂව ජංගම හා ක්ෂණික අනුපාතවල සුළු වර්ධනයක් පෙන්නුම් කළද, ලැබිය යුතු ණයගැති ශේෂය තුළ කල් ඉකුත් වූ ණයගැති ශේෂය රු.14,736,779 ක් වූ බැවින් ජංගම හා ක්ෂණික අනුපාත සතුටුදායක මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 වරිපනම්

සමාලෝචිත වර්ෂයේදී අයකර ගතයුතු රු.19,452,886 ක බදු මුදලින් රු.6,645,518 ක් පමණක් අයකර ගැනීම නිසා වර්ෂ අවසානයට හිඟ මුදල රු.12,807,368 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.2** බදු කුලී

---------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමරවලින් රු.3,083,090 ක හිඟ බදු ශේෂයක් නිරීක්ෂණය වූ අතර, හිඟ බදුකුලී අයකිරීම සඳහා නගර සභා ආඥා පනතේ 170(අ)(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.3** මුද්දර ගාස්තු

---------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වෙනත් ආදායම් ශේෂයට ඇතුළත්ව තිබුණු ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.51,518,405 ක් විය. ඉන් රු.49,859,838 ක මුදලක් ඉකුත් වර්ෂයටත් පෙර කාලයට අදාළව ලැබිය යුතු මුදල් ශේෂයක් විය.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **කාර්යසාධනය**

-----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 සිට 2019 දක්වා වූ නගර සභාවේ සිව් අවුරුදු සැලැස්ම යටතේ කර්මාන්ත 29 ක් ක්‍රියාත්මක කිරීමට හා කාර්යාල නවීකරණය වෙනුවෙන් රු.19,320,000 ක් ඇස්තමේන්තු කර තිබුණ ද, එම කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) නගර සභා බලප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති 07 ක් සඳහා ලැබී තිබුණු රු.4,741,579 ක මුදලක් එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකර වසර 04 ක සිට ඉතුරුම් ගිණුම් 07 ක තැන්පත් කර තිබුණි.

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පුරප්පාඩු 13 ක් හා අනුමත නොවූ තනතුරු 20 ක අතිරික්තයක් විය. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට හෝ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවයෙන් විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින් තිදෙනෙකුගෙන් ද, අනියම් හා ආදේශක සේවකයින් 55 දෙනෙකුගෙන් ද, අයවිය යුතු එකතුව රු.282,190 ක් වූ සේවක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නගර සභාවට අයත් ධීවර වෙළඳ සංකීර්ණය ගිවිසුම් ප්‍රකාරව එක්වන් මුදල් අය කිරීමකින් තොරව බදු දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.259,584 ක හිඟ ශේෂයක් පැවැතුණු නමුත්, එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ආසියානු සංවර්ධන බැංකුවෙන් 1998 දී ලබාගෙන තිබුණු රු.51,792,000 ක ණය මුදලේ වාරික ගෙවීම 2010 ජුනි 30 දිනෙන් පසු සිදු නොවීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ගෙවිය යුතු හිඟ ණය මුදල රු.33,857,798 ක් වූ අතර, ඊට අමතරව රු.40,980,107 ක පොලී මුදලක් ද ගෙවීමට සිදු වී තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) (i) බදුකුලී ගෙවීම අඛණ්ඩව මාස 03 ක් පැහැර හැරියහොත් හිඟ කුලී අය කර ගැනීම සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ 170(අ)(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළහැකි වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ii) ගිවිසුමේ අංක 5.3.2 දරන කොන්දේසිය ප්‍රකාරව ජලය හා විදුලිය කඩබදු හිමියා විසින් දැරිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කඩ කාමර 14 කින් රු.48,400 ක ජල ගාස්තු අයවිය යුතුව තිබුණි.

(ආ) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා පමණක් පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණ කිරීම නිසා සභාව විසින් බඳවාගෙන තිබුණු සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීමට සභාවේ ආදායමින් රු.7,746,591 ක් වැය කිරීමට සිදුව තිබුණි.

(ඇ) නගර සභා ආඥා පනතේ 164(2) වගන්තිය ප්‍රකාර සංචාරක සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝටල්, ආපනශාලා හා ලැගුම්හල්වල සියලුම ආදායම් මත අය කරනු ලබන සියයට 1 බද්ද අය කිරීමේ දී හෝටල් කිසිවකින් විගණනය කරන ලද ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

රු.640,000 ක ඇස්තමේන්තුවක් මත ඕකන්ද පොදු නාන ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය ක්‍රියාත්මක කිරීමේ දී ළිඳ අවට භූමිය කඩා වැටීම නිසා ඇති වූ අවදානම් තත්ත්වය හේතුවෙන් ඉංජිනේරු සහකාරගේ උපදෙස් මත රු.53,300 ක අමතර වියදමක් දරා ළිඳ වසාදමා තිබුණි. කොන්ත්‍රාත්කාර සමිතිය එතෙක් සිදුකළ වැඩ වෙනුවෙන් රු.148,760 ක බිල් පත්‍රයක් ඉදිරිපත් කර තිබුණි.

**3.5 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා භූමියේ දිරාපත් වෙමින් පවතින ට්‍රැක්ටරයක්, පිරිවැය රු.259,000 ක් වූ ත්‍රී රෝද රථයක් හා රු.432,500 ක් වූ අත් ට්‍රැක්ටරයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට 2017 ජුනි 21 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගබඩා ශේෂයට ඇතුළත් 2014 වර්ෂයටත් පෙර මිලදී ගෙන තිබුණු රු.181,197 ක් වටිනා දැව තොගය 2017 ජුනි 21 දින වනවිටත් ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) කාය වර්ධන මධ්‍යස්ථානය සකස් කිරීමට සහ උපකරණ මිලදී ගැනීමට එකතුව රු.3,302,458 ක වියදම් දරා තිබුණ ද, 2015 ඔක්තෝබර් මස සිට එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) නගර සභාව විසින් කසළ කළමනාකරණය සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර, දෛනිකව එකතු වන කසළවලින් දිරන කසළ මොන්රෝවියාවත්ත කසළ අංගනය වෙත යැවීමටත්, නොදිරන කසළ කොළඹ මාර්ගයට මීටර් 500 ක් දුරින් පිහිටි හල්වතුර නැමති වගුරු බිමට බැහැර කර, මාස 03 කට වරක් පස් දමා වැසීමටත් කටයුතු කරමින් පැවතුණි. ඉඩම තුළ කසළ ගොඩගසා තිබීම නිසා මදුරුවන් හා මැස්සන් ගහනය වැඩිවීමෙන් බලප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර තත්ත්වයක් උද්ගත වී තිබුණි. එසේම කසළ බැහැර කරන භූමියට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(ආ) නගර සභා බලප්‍රදේශයේ කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ලැබුණු යන්ත්‍රයක් 2012 වර්ෂයටත් පෙර සිට කිසිදු ප්‍රයෝජනයකට යොදවා නොගෙන ගබඩාවේ රඳවා තිබුණි. එම යන්ත්‍රයට අදාළ කිසිදු තොරතුරක් සභාව සතුව නොතිබුණු අතර, එහි වටිනාකම ද මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 07 ක එකතුව රු.46,014,168 ක් වූ ඉතිරිවීම් ද, වියදම් විෂයයන් 02 ක සීමාවන් ඉක්මවා දරා ඇති වියදම රු.590,203 ක් ද, ආදායම් විෂයයන් 06 ක ළඟා කර නොගත් ඉලක්කගත ආදායම රු.39,416,443 ක් ද විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

-----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. සභාව විසින් අභ්‍යන්තර විගණන නිලධාරියෙකු ලෙස සංවර්ධන නිලධාරියෙකු පත්කර තිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-------------------------------------------------------

2009 ජූනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනය**

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| **පද්ධතිය** | | **පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු** |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. |
| | (ii) | මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති සමහර අයිතමයන් සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) | වසර හතරකටත් අධික කාලයක සිට පැවත එන ගිණුම් ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iv) | සමහර ප්‍රාග්ධන වියදම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. |
| (ආ) වාහන පාලනය | (i) | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) | කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව වාහන තුනක් සභා භූමියේ දිරාපත් වෙමින් පැවතුණි. |
| (ඇ) ලේඛන නඩත්තු කිරීම | (i) | සභාව විසින් වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) | හානි පාඩු පිළිබඳ තොරතුරු ඇතුළත් කර, හානි පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | (iii) | උපලේඛන සමඟ ලෙජර් ගිණුම් වල ශේෂයන් එකිනෙක නොගැලපුණි. |
| (ඈ) ආදායම් පාලනය | (i) | හිඟ ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවැතුණි. |
| | (ii) | මුද්දර ගාස්තු ආදායම් යාවත්කාලීනව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) | වසර 04 ක කාලයක් ඉක්මවන ලද හිඟ කඩබඳු කුලී පැවැතුණි. |
| | (iv) | වරිපනම් බදු අයකර ගැනීම මන්දගාමී තත්ත්වයෙන් සිදු වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) සේවක මණ්ඩල කළමනාකරණය | (i) | නගර සභාවේ අනියම් / ආදේශක / අතිරික්ත කම්කරුවන් 20 දෙනෙකුගේ තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) | පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) | අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා බඳවාගත් ආරක්ෂක නිලධාරීන් 08 දෙනෙකුට සභා අරමුදලින් වැටුප් ගෙවා තිබුණි. |
| (ඊ) අයවැය පාලනය | (i) | වියදම් විෂයයන් 07 කම ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් ඉතිරි වීම් පැවැතුණි. |
| | (ii) | වියදම් විෂයයන් 02 ක අනුමත සීමාවන් ඉක්මවා වියදම් දරා තිබුණි. |
| | (iii) | ආදායම් විෂයයන් 06 ක ඇස්තමේන්තු ඉලක්ක ලඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. |
| | (iv) | මූලධන වියදම්වල ඇස්තමේන්තුගත අගය සහ සත්‍ය අගය අතර පරතරය සියයට 50 ක්ව පැවැතුණි. |
| | (v) | අයවැය පිළිබඳව පසුවිපරම් කර සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |